**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.08.18 වන දින පැවති මාසික මහ සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 අගෝස්තු මස 18 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සූරවීර මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද , ලේකම්තුමා හා නිලධාරීතුමිය ද සභා කටයුතු නැරඹීම සඳහා පැමිණි මෙලානි සුමනවීර මහත්මිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.07.14)**

2022.07.14 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.07.14 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (I) උප වගන්ති ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.1 තත්ත්වාගණනය කළ මතය යටතේ විගණකාධිපතිතුමා විසින් දක්වා ඇති මතය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.එය මෙසේ ය.

"මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ."

**03.** සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම් / පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.

**04.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.

**05.** යථා පරිදි කල් දී ඇති යෝජනා.

**I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** මේ වන විට රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් භාණ්ඩ හා සේවා සියල්ලෙහි මිල ගණන් විශාල වශයෙන් වැඩිවීමක් සිදු වී ඇති නිසා වර්ෂ ආරම්භයේ දී සභාව අපේක්ෂා කළ වියදම් සීමාවන් ඉක්මවා වියදම් දැරීමට සිදුව තිබීම හා අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා අතිරික්ත සංවර්ධන නිලධාරීන් ප්‍රමාණයක් සභාව වෙත අනුයුක්ත කිරීම හේතුවෙන් වැටුප් ගෙවීම වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන සීමාවන් ද ඉක්ම යමින් පවතී.ඒ අනුව අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් පළාත් සභාව හරහා වැටුප් ප්‍රතිපූර්ණය කරනු ලැබුව ද එය අයවැය වාර්තාව තුළ පෙන්වා නොමැති බැවින් ඔවුන් වෙනුවෙන් ප්‍රතිපූර්ණය වන මුදල් ප්‍රමාණයන් වැටුප් වශයෙන් දැරිය යුතු වැය ප්‍රමාණයන් පරිපූරක අයවැයක් හරහා සම්මත කර ගැනීම සුදුසු වේ.එබැවින් මේ සමඟ අමුණා ඇති පරිපූරක අයවැය වාර්තාව සභා සම්මත කර ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම පරිපූරක ඇස්තමේන්තුවේ ආදායම් ශීර්ෂ 1-71 හා වැය ශීර්ෂ 101-1 යටතේ සේවක වැටුප් රු.14,037,000.00 ක ලෙස සටහන් වී ඇති බවත් , එය රු.1,403,700.00 ලෙස නිවැරදි විය යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදී.එය නිවැරදි විය යුතු බව ගරු සභාපතිතුමා ද පෙන්වා දෙන ලදී.

<u>තීරණ අංක 01</u>

රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් භාණ්ඩ හා සේවා සියල්ලෙහි මිල ගණන් විශාල වශයෙන් වැඩිවීමක් සිදු වී ඇති නිසා වර්ෂ ආරම්භයේ දී සභාව අපේක්ෂා කළ වියදම් සීමාවන් ඉක්මවා වියදම් දැරීමට සිදුව තිබීම හා අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා අතිරික්ත සංවර්ධන නිලධාරීන් ප්‍රමාණයක් සභාව වෙත අනුයුක්ත කිරීම හේතුවෙන් වැටුප් ගෙවීම වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන සීමාවන් ද ඉක්ම යමින් පැවතීම නිසා අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් පළාත් සභාව හරහා වැටුප් ප්‍රතිපූර්ණය කරනු ලැබුව ද එය අයවැය වාර්තාව තුළ පෙන්වා නොමැති බැවින් ඔවුන් වෙනුවෙන් ප්‍රතිපූර්ණය වන මුදල් ප්‍රමාණයන් වැටුප් වශයෙන් දැරිය යුතු වැය ප්‍රමාණයන් ඇතුලත්ව සකස් කළ පරිපූරක අයවැය වාර්තාව සභා සම්මත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** කුට්ටපිටිය ප්‍රදේශයේ පිහිටි කිරිඳි ඇල්ල හා ඒ ආශ්‍රිත ප්‍රදේශය සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ යකුපිටි සමන් ප්‍රියදර්ශන මහතා වෙත ලබා දෙන ලෙස ලිපියකින් ඉල්ලීම් කර ඇති අතර විශේෂයෙන් පවතින පරිසර පද්ධතියට කිසිදු වෙනසක් හෝ හානියක් සිදු නොකරන බවත් ඇල්ලට පැමිණෙන නරඹන්නන්ගේ ආරක්ෂාව සඳහා විශේෂ වැඩපිළිවෙලක් යොදනු ලබන බවත් , එමඟින් කිරිඳි ඇල්ලට පැමිණෙන දේශීය විදේශීය සංචාරකයන් සඳහා උපරිම පහසුකම් හා ආරක්ෂාව සහිතව ඇල්ල නැරඹීමට හා විවේකීව කාලය ගත කිරීමට වැඩි අවස්ථාවක් සලසා දෙන බවත් , ඇල්ල සඳහා සුදුසු මාසික හෝ වාර්ෂික බදු මුදලක් අප සභාවට ගෙවීමට කටයුතු කරනු ලබන එම ලිපිය මඟින් දන්වා ඇත.ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මීට පෙර සබරගමු පළාත් සංචාරක අමාත්‍යාංශයත් සමඟ එකතු වී කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීම සඳහා 2011 වර්ෂයේ සිටම ඇස්තමේන්තු සකස් කළ ද සැළකිය යුතු මුදලක් ලබා ගෙන එය සංවර්ධනය කිරීමට නොහැකි වූ බවත් , වත්මනෙහි පවතින මිල ගණන් සමඟ සසඳා බලන විට පඩිපෙළ සකස් කිරීමට ද විශාල මුදලක් වැය වන බවත් , එනම් කිරිඳි ඇල්ල සභාවට නඩත්තු කළ නොහැකි තත්වයක පවතින බවත් , දැනට එමඟින් සභාවට කිසිම ආදායමක් නොලැබෙන බවත් ය.කුට්ටපිටිය ප්‍රදේශයේම පදිංචි එහි හෝටලයක් ඉදිකරන යකුපිටි සමන් ප්‍රියදර්ශන මහතා විසින් ඉහත ඉල්ලීම ලිඛිතව සිදු කළ බවත් , විදේශ කාන්තාවක් සමඟ විවාහ වී සිටින එතුමාගේ බලාපොරොත්තුව දේශීය සංචාරකයන්ට වඩා විදේශ සංචාරකයන් ගෙන්වා ගැනීම බවත් , ගිය මාසයේදිත් විදේශ සංචාරකයින් 20කටත් වඩා අධික ප්‍රමාණයක් එතුමා ලංකාවට රැගෙන ආ බවත් , ඔහුගේ ඉඩමේ විදේශ සංචාරකයින්ට නවාතැන් ගැනීමට ස්ථාන සකස් කර ඇති බවත් , එහි දී එම සංචාරකයින්ට කිරිඳි ඇල්ල ද සංචාරය කිරීමට අවස්ථාව සලසා දීම එතුමාගේ බලාපොරොත්තුව බවත් , සභාවට මුදලක් ගෙවීමටද එම තැනැත්තා කැමැත්ත ප්‍රකාශ කළ බවත් ගරු සභාපතිතුතමා පවසන ලදී.ලේකම්තුමා ප්‍රධානව කාර්මික නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් ද මීට සම්බන්ධ කර ගෙන කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීම සුදුසු බවත් , පළමුව එතුමාගේ ව්‍යාපෘති සැලැස්ම සභාවට ඉදිරිපත් කර එය සභා සම්මත වුවහොත් ඔහු සමඟ ගිවිසුම් ගත වී සභාවේ අධීක්ෂණය යටතේ එතුමාගේ වියදමෙන් පළමුව කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීම සුදුසු බවත් , මෙහි දී ගිවිසුම ද සභාවට ඉදිරිපත් කර අඩුපාඩු සංශෝධනය කර සභා අනුමැතිය ලබා ගත යුතු බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ කුට්ටපිටිය ප්‍රදේශය දියුණු වෙමින් පවතින බවත් , කිරිඳි ඇල්ලෙන් සභාවට ආදායමක් නොලැබෙන නිසා ආදායමක් ලබා ගැනීමට වැඩ කටයුතු සංවිධානය කිරීම සුදුසු නමුත් කිසිවෙකුට සභාව යටතේ බදු දීම නුසුදුසු බවත් , පැල්මඩුලෙහි බොහෝ ජනයාට ජලය ලැබෙන්නේ එමඟින් බවත් , මෙහි දී මෙම පුද්ගලයා පවසන ආකාරයට ම කටයුතු සිදු කරයි යන්න නිගමනය කළ නොහැකි බවත් , අවසානයේ එම පුද්ගලයාට අවශ්‍ය පරිදි සභාවට කටයුතු කිරීමට සිදු වන බවත් , ව්‍යාපාරිකයන් මුදල් පසුපස හබා යන බවත් , බොහෝ අවස්ථා වල මෙවැනි තත්වයන් පිළිබඳව අසන්නට ලැබෙන බවත් , එනිසා සභාවට හැකි පමණින් සභාව යටතේ තබා ගනිමින් කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීම සුදුසු බවත් , මෙම යෝජනාව සම්බන්ධව තවදුරටත් අධීක්ෂණය කර තව වාරයක් සිතා කටයුතු කිරීම සුදුසු බවත් ය.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ කාලෝචිත යෝජනාවක් බවත් , කිරිඳි ඇල්ල ලංකාවේ 09 වන දියඇල්ල බවත් , ඓතිහාසික ස්ථානයක් බවත් , සභාව සතු වත්කම් වලින් නිසි ප්‍රයෝජනයක් නොගන්නා බවත් , කිරිඳි ඇල්ලට බහින්නටවත් ස්ථානයක් නොතිබූ බවත් , තමන් සභාපති ලෙස කටයුතු කරන අවධියේ කිරිඳි ඇල්ලට බැසිය හැකි ස්ථානයක් සොයා ගෙන පඩිපෙල සකස් කර එමගින් මසකට රු.40,000.00 ක ආදායමක් ලබා ගත් බවත් , එකල සිදු කළ සංවර්ධනයන් එනම් මුරකුටි , දැන්වීම් පුවරු , පරිසරය ආරක්ෂා කිරීමට සිටවපු ගස් ආදිය සියල්ල අද අභාවයට ගොස් ඇති බවත් , සංවර්ධනය කළ හැකි පුද්ගලයෙකුට හෝ සංවිධානයකට කිරිඳි ඇල්ල ලබා දී සංවර්ධන කිරීම සුදුසු බවත් , මෙම පුද්ගලයාට විදේශ සබඳතාවක් තිබීම හේතුවෙන් කිරිඳි ඇල්ල හොඳ ආකර්ෂණීය විදේශ විනිමය ලබා ගත හැකි ස්ථානයක් බවට පරිවර්තනය කළ හැකි බවත් ය.නමුත් මෙහි දී තනි පුද්ගලයෙකුට ලබා දීමේ දී ගැටලුවක් ඇති විය හැකි නිසා මීට ඉල්ලුමක් ඇති අනෙක් පුද්ගලයින් සම්බන්ධව ද සලකා බැලීම සුදුසු බවත් , සම්පූර්ණ බලය සභාව සතු වන ආකාරයටත් ඕනෑම අවස්ථාවක සභාවට එයට ඇතුළු විය හැකි ආකාරයටත් මෙය සංවර්ධනය වූවාට පසුව නැවත සභාවට ලබා ගත හැකි ආකාරයටත් වඩා හොඳ ගිවිසුමක් සකස් කළ යුතු බවත් , සංවර්ධන කටයුත්තක් ආරම්භ කිරීමට ප්‍රථම ඊට විරුද්ධ වීම නුසුදුසු බවත් , දැනට කිරිඳි ඇල්ලෙහි රත්තරන් භාණ්ඩ සොරකම් කිරීම් තිබුන ද කිසිවෙකුට හෝ භාර දුන් පසුව ඔවුන්ට කොන්දේසි දමා එම ක්‍රියා නතර කිරීමට අවස්ථාව උදා වෙන බවත් , පුළුන් ඇල්ල හා මරක්කල ඇල්ල ද පසුව මේ අකාරයට සංවර්ධනය කළ හැකි බවත් එතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ගරු සභාපතිතුමා මීට මාස 06ට පමණ පෙර පැල්මඩුල්ලෙහි විශාල වෙනස් සිදු කරන බවට පැවසූ නමුත් පැවති වාතාවරණය මත එතනට ළඟා වීමට නොහැකි වූ බවත් , කිරිඳි ඇල්ල ගරු සභාපතිතුමාගේ කොට්ඨාසයේ සංකේතයක් බවත් , පරිසර අමාත්‍යාංශය , පළාත් සභාව , ගරු ආණ්ඩුකාරතුමාගෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගෙන සැලැස්මක් සාදා අප සභාවේ අතිරික්ත සේවකයන් යොදවා වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවත් , පරිසර කමිටුව තෙවතාවක් පමණක් කැඳවූ බවත් , පරිසර කමිටුව කැඳවිය යුතු බවත් , කිරිඳි ඇල්ල සභාවේ වත්කමක් ලෙස තබා ගනිමින් පඩිපෙළ සකස් කර , නැරඹුම් ස්ථානයක් සකස් කිරීම සුදුසු බව ය.

ඊට අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ පවතින වාතාවරණය සමඟ කිරිඳි ඇල්ල සභාවට නඩත්තු කළ හැකි මට්ටමක නොමැති බවත් , තමන් විසින් කිරිඳි ඇල්ලෙහි කළ සංවර්ධනයන් කිසිවක් වත්මනෙහි නොමැති බවත් , දැනට කිසිම ආදායමක් මෙමගින් සභාවට නොලැබීම නිසා ඉහත යෝජනාවට සහය ලබා දීම සුදුසු බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ කිරිඳි ඇල්ල සංවර්ධනය කළ යුතු බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා හා මාධ්‍යවේදී අසිත ඉන්දික මැතිතුමා මේ සම්බන්ධව විශාල ඩැඩපිළිවෙලක යෙදුනු බවත් , මෙහි දී ව්‍යාපාරිකයන් උත්සාහ කරන්නේ රත්තරන් භාණ්ඩ සොරකම් කර හෝ එම ස්ථානයෙහි ව්‍යාකූල තත්වයක් ඇති කර එය තමන් සතු කර ගැනීමට බවත් , මෙහි දී එක් පුද්ගලයෙකු මතම නොසිට විනිවිද භාවයෙන් කටයුතු සිදු විය යුතු බවත් , මෙම තැනැත්තාගේ ව්‍යාපෘති සැලැස්ම සභාවට ඉදිරිපත් කර අධීක්ෂණය කර තීරණයක් ලබා ගැනීම සුදුසු බවත් , අතිරික්ත සේවකයන් ද මීට සම්බන්ධ කර ගැනීම සුදුසු බවත් , සභාවට ද මෙමගින් ආදායමක් ලබා ගත යුතු බවත් , ගිවිසුම ද සභාවට ඉදිරිපත් කර සංශෝධන තිබේ නම් ඒවා ද ඇතුල් කළ යුතු බවත් , එම ආකාරයට ගියහොත් මෙය සාර්ථක කර ගත හැකි බවත් , එය සාර්ථක වුවහොත් අනිත් දිය ඇලි ද ඒ ආකාරයටම කළ හැකි බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා අදහස් ඉදිරිපත් කරමින් පවසා සිටියේ මෙම යෝජනාව ඉතා වටිනා බවත් , මෙය සභාවට සම්පතක් බවත් , මෙම ඉල්ලුම්කරු ඉතා පැහැදිලි ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් , ශ්‍රී ලංකාවට විශාල ආදායමක් විදේශීය සංචාරකයන්ගෙන් ලබා ගත හැකි බවත් , මේ සම්බන්ධව ප්‍රශංසාව පල කරන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ ඉඹුල්පෙ ප්‍රාදේශීය සභාවට අයත් “දිය පහර” නම් ස්ථානය ටෙන්ඩර් පදනම මත ලබා දී ඇති බවත් , කුණු කසල දැමීමට සිලින්ඩර් තිබුන ද කුණු කසල සෑම ස්ථානයකම දමා තිබූ බවත් , වැසිකිළි පැවතුන ද පහසුකම් නොමැති බවත් , රජයෙන් ටෙන්ඩර් දී සිදු කරන අවස්ථා වල දී පරිසර ආරක්ෂාව පිළිබඳව මෙන් ම පිරිසුද භාවය පිළිබඳව සැලකිළිමත් නොවන බවත් , පෞද්ගලික ආයතනයකට ලබා දුන් පසුව ඔවුන්ගේ ආදායම් මාර්ගය එය නිසා කැප වී එය සිදු කරන බවත් , පරිසර ආරක්ෂක අමාත්‍යාංශය මෙන් ම සංචාරක අමාත්‍යාංශය වැනි ආයතන ද මීට සම්බන්ධ කර ගනිමින් ගිවිසුම සකස් කළ හැකි නම් වටිනා බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා පවසා සිටියේ ඉතා හොඳ කාලෝචිත යෝජනාවක් බවත් , අප රටේ පවතින තත්වයක් සමඟ රටේ ආර්ථික පැත්තට විශාල ඉඩකඩක් ලබා දීමට සිදු වන බවත් , කිරිඳි ඇල්ල පාරිසරික මෙන් ම ආර්ථික වටිනාකමක් ඇති ස්ථානයක් බවත් , කිරිඳි ඇල්ල පැල්මඩුල්ලෙහි ප්‍රධාන සංධිස්ථානයක් බවත් , මෙම පරිසර පද්ධතිය ආරක්ෂා විය යුතු බවත් , මෙම යෝජනාව මඟින් එම ප්‍රදේශය සංවර්ධනය වනවා සේම ගමේ මිනිසුන්ගේ ජන ජීවිත මට්ටම ඉහළ නංවා ගැනීමට අවස්ථාව උදා වෙන බවත් , එනම් නව නිර්මාණ විකිණීම , වෙළෙඳසැල් ඉදිකර අදායම් රැස් කිරීම , රා වැනි දේශීය පානයන් විකිණීම වැනි දේවල් වලින් ගම් වාසීන්ට ආදායම් උපයා ගැනීමට අවස්ථාව උදා වන බවත් , මෙම තැනැත්තාට නිසි නීති පද්ධතියකට යටත්ව ලබා දී කිරිඳි ඇල්ලෙන් ලබා ගත හැකි වටිනාකම ලබා ගැනීම සුදුසු බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ ගරු උප සභාපතිතුමා විසින් කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වන බවත් , රටේ පවතින ආර්ථික ප්‍රශ්න හමුවේ මිනිසුන් රත්තරන් භාණ්ඩ සොරකම් කිරීමට පෙළඹෙන බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා එක් සභා භාරයක දී මේ සම්බන්ධව කළ යෝජනාව ඉතා වටිනා බවත් , කෙසේ වෙතත් පෞද්ගලික ආයතන රජයේ දේවල් සංවර්ධනය කරයි කියා සිතිය නොහැකි බවත් , පෞද්ගලික අංශයට ලබා දීමට අවශ්‍ය නොවන බවත් , නව ආණ්ඩුව සමඟ එක් වී මෙය සභාව සතුව තබා ගෙන කටයුතු කිරීම සුදුසු බව තමන්ගේ මතය බවත් , කෙසේ වෙතත් ව්‍යාපෘති සැලැස්ම බලා , ඊට සියලු දෙනාගේම එකඟත්වය ලැබුනහොත් තීරණයක් ගැනීම සුදුසු බවත් ය.

ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ තමන් ද කිරිඳි ඇල්ල නැරඹීමට ගරු උප සභාපතිතුමා සමඟ ගිය බවත් , එම අවධියේ මෙම ස්ථානය දර්ශනීය , ආකර්ෂණීය ලෙස සකස් කර තිබූ බවත් , වත්මනෙහි කැළෑව වැවී ඇති බවත් , රත්තරන් භාණ්ඩ සොරකම් කරන බවත් , එහි සංවර්ධනයක් සිදු වේ නම් සන්තෝෂ වන බවත් , මෙය සංවර්ධනය කිරීමට පෙර ම ඊට විරුද්ධ නොවී ඊට සහයෝගය ලබා දීම සුදුසු බවත් , අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ මණ්ඩලයක් පත් කර , නීති රෙගුලාසි දමා නිවැරදිව කළහොත් එමඟින් විශාල ආදායමක් ලබා ගත හැකි බවටත් එතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ශ්‍රී ලංකාවේ උස ම දිය ඇලි අතරින් 09 ස්ථානය හිමි වන කිරිඳි ඇල්ල දිය ඇල්ල අඩි 347ක් උස බවත් , පැල්මඩුල්ල බල ප්‍රදේශය ඇතුලත දිය ඇලි 16ක් පවතින බවත් , පෞද්ගලික ආයතනයක් සමඟ එක් වී කේබල් කාර් වැනි දේ වලින් මීටත් වඩා සංවර්ධනය කිරීමට හැකි නම් එය වටිනා බවත් , මෙමඟින් විශාල ආදායමක් ලබා ගත හැකි බවත් , තමන් මුහුණු පොතෙහි පල කළ ලිපියක් දැක පරිසර අමාත්‍යාංශයෙන් ද දිය හැකි උපරිම සහය ලබා දෙන බව එක් අවස්ථාවක සඳහන් කළ බවත් , එක් පුද්ගලයෙකු මත යාම ගැටළුවක් විය හැකි බවත් , මීට පෙර ම මේ සම්බන්ධව යෝජනාවක් සභාවට ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ගයකට යා යුතුව තිබූ බවත් , රත්තරන් ආභරණ සොරකම් කිරීම පෙර සිට ම පවතින බවත් , මෙය හොඳ යෝජනාවක් බවත් සභාවේ අනන්‍යතාව ඇතිව සභාවේ සේවකයන් දමා මෙය සිදු කළ යුතු බවත් , කිසිවෙකුට කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීමෙන් හානියක් සිදු නොවිය යුතු බවත් , නැවත සභාවට ලබා ගත හැකි පරිදි ගිවිසුම සකස් විය යුතු බවත් , පරිසරය ආරක්ෂා කර ගැනීමට තමන් එදා සිට ම හඬ නැගූ බවත් , දිය ඇලි හිදීමට හේතුව අවිධිමත් ලෙස ජලය ලබා ගැනීම බවත් , මේ සඳහා ද නිශ්චිත වැඩපිළිවෙලක් අවශ්‍ය බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීම සම්බන්ධව ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමාට ස්තූතිවන්ත වන බවත් , කිරිඳ ඇල්ලේ සුන්දරත්වය විඳීමට එන අයගේ රත්තරන් බඩු සොරුන් විසින් සොරකම් කරන බවත් , ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා අනවශ්‍ය යෝජනා වලට හා රජයේ ආයතන වැඩි වියදම් වලට නොයන ලෙසත් ඒවා ඔවුන් භාර නොගන්න බව පැවසූ බවත් , ස්ථිර වැඩපිළිවෙලක් කරන ලෙස පැවසූ බවත් , එතුමා ද සංචාරක කර්මාන්තය සඳහා විශාල වැඩපිළිවෙලක් කරන  බවත් , සුළුවට හෝ සභාවෙන් මෙය සංවර්ධනය කර ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සුදුසු බවත් ය.සභාව විසින් ව්‍යාපෘති සැලැස්මක් සාදා ටෙන්ඩර් කිරීම හෝ සංචාරක අමාත්‍යාංශයට ලබා දීම සුදුසු බවත් , එය ගරු ජනාධිපතිතුමාට ලැබුනු පසු තවත් සාර්ථක කර ගත හැකි බවත් , ප්‍රායෝගිකව මේ ආකාරයට සාර්ථක කිරීම සුදුසු බවත් එතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා පවසා සිටියේ ගරු සභාපතිතුමා අවංකව මෙය සිදු කිරීමට සූදානම් වුව ද මිනිසුන්ගේ මතය විවිධාකාර බවත් , එය සමාජගත වන බවත් , එනිසා ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය නිර්දෝෂී විය යුතු බවත් , විනිවිදභාවයෙන් විය යුතු බවත් , යම්කිසි කාල සීමාවකට ලබා දී නැවත සභාවට ලබා ගෙන ටෙන්ඩර් ලබා දීමට හැකි නම් මෙය සභාවට මුදල් උපයන මාර්ගයක් වන බවත් , සභාවක් වශයෙන් මෙම අවස්ථාව වටිනා බවත් , මෙය සිදු කිරීම සුදුසු බවත් ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ඉතා වටිනා බවත් , එම පුද්ගලයා කිසිවිටක මෙම ඉල්ලීම සිදු කළේ කිරිඳි ඇල්ලෙන් මුදල් බලාපොරොත්තුවෙන් නොවන බවත් , එතුමාගේ බලාපොරොත්තුව පැල්මඩුල්ලට විදේශ සංචාරකයන් ගෙන්වා ගෙන ඔවුන්ට ලබා දෙන පැකේජය තුළින් කිරිඳි ඇල්ල නැරඹීමට ද අවස්ථාව ලබා දීම බවත් , සෑම දෙයක් ම අසුභවාදීව නොබැලිය යුතු බවත් , සභාවට කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීමට තරම් මුදල් ප්‍රතිපාදන මෙම අවස්ථාවේ නොමැති බවත් , කූට්ටපිටිය සුන්දර පරිසර පද්ධතියක් බවත් , එහි නව සංචාරක ස්ථාන කිහිපයක් ගොඩනැගෙමින් පවතින බවත් , එහි දී කිරිඳ ඇල්ල ද සංචාරය කළ හැකි පරිදි සංවර්ධනය කිරීම ඔහුගේ බලාපොරොත්තුව බවත් , කිරිඳි ඇල්ල වර්තමානයේ කැළෑවට ගොස් ඇති බවත් , කිසිවෙකුට මෙය පුද්ගලිකව ලබා දීමට අවශ්‍යතාවයක් නොමැති බවත් , මෙහි පඩිපෙල් ටික සකස් කර ගැනීම තමන්ගේ බලාපොරොත්තුව වූ බවත් , එතුමා මෙය සංවර්ධනය කළ පසුව නැවත සභාවට ලබා ගත හැකි බවත් , ඉන් පසුව අපට සභාවෙන් සේවකයන් යොදවා සංචාරකයින්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කර සභාවට ආදායමක් ලබා ගත හැකි බවත් , සභාවේ එකඟතාවය හිමි වේ නම් පමණක් මෙය සිදු කරන බවත් , මෙය සංවර්ධනය කළහොත් දරුවෙකුට හෝ එහි සුන්දර්තය විඳ ගැනීමට හැකි වන බවත් , සංචාරක කර්මාන්තය විදේශ විනිමය ගලා එන ප්‍රධාන මාර්ගයක් බවත් , මෙම අවස්ථාවේ ඩොලර් වැදගත් බවත් , රජයයි පුද්ගලික අංශයයි එකතු වී බොහෝ සංවර්ධනයන් සිදු කරන බවත් , බොහෝ අයගේ අදහස පරිදි ව්‍යාපෘති සැලැස්ම ලබා ගෙන තීරණයක් ගැනීම සඳහා සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවත් ය.

**<u>තීරණ අංක 02</u>**

කූට්ටපිටිය ප්‍රදේශයේ පිහිටි කිරිඳි ඇල්ල හා ඒ ආශ්‍රිත ප්‍රදේශය සංචාරක ප්‍රවර්ධන කටුයතු සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබා දෙන ලෙස යකුපිටි සමන් ප්‍රියදර්ශන මහතා කළ ඉල්ලීම සලකා බලා , පළමුව එම ඉල්ලුම්කරුගෙන් මේ හා සම්බන්ධ ව්‍යාපෘති සැලැස්ම ලබා ගෙන එය සභාවට ඉදිරිපත් කර ඒ අනුව මේ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීම සුදුසු බවට ඒකහමතිකව සභා සම්මත විය.

**03.** කාර්යාල කාර්ය සහායක ඊ.මානෙල් ඒකනායක මිය 1991.02.14 දින සිට ආදේශක පදනම මත මෙම කාර්යාලයේ සේවය කර ඇති අතර 2001 ජූලි මස සිට 2008 ජනවාරි දක්වා කාල සීමාව තුළ EPF අයකර නොමැති බැවින් එම මුදල වන රු.67,577.10 ක මුදල ගෙවන ලෙස කම්කරු උසාවිය මඟින් දන්වා එවා ඇත.මෙම මුදල ගෙවීම සඳහා කොමසාරිස් අනුමැතිය සඳහා යොමු කල අතර එහි දී එම කාල වකවානුව තුළ සේවය කළ වගකිවයුතු අදාල නිලධාරින්ගෙන් අධිභාර මුදල් හා EPF 8% අයකිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.මෙම සේවිකාව හට 2001 ජූලි මස සිට 2008 ජනවාරි මස දක්වා EPF 12% ක මුදල අප සභාව මඟින් ගෙවිය යුතු බැවින් මේ සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ඊ.මානෙල් ඒකනායක මිය අප සභාවේ කැලි

ක්‍රමයට , අනියම් පදනමෙන් යන විවිධාකාරයෙන් සේවය කර ඇති බවත් , සමහර කාල වල දී EPF අය කර නොමැති බවත් , එම හේතුවෙන් ඒ හා සම්බන්ධ සියලු දෙනාගෙන් අධිභාර මුදල් අයකිරීමට සිදු වී ඇති බවත් , සභාව මඟින් ගෙවිය යුතු කොටස සභාව මඟින් ගෙවීමට සිදු වන බවත් ය.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ පරිපාලන කටයුතු හරියාකාරව සිදු වෙනවා නම් මෙවැනි ගැටළු ඇති නොවන බවත් , මෙය සභාවට කැළලක් බවත් , ඉදිරියේ දී මෙවැනි ගැටළු ඇති නොවන පරිදි අවධානයෙන් කටයුතු සිදු කළ යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙය පැරණි සිද්ධියක් බවත් , එකල තමන් ද සභාවේ කටයුතු නොකළ බවත් , වර්තමානයේ මෙවැනි ගැටළු ඇති නොවන පරිදි නිලධාරීන් ද ඉතා ඕනෑකමින් රාජකාරී කටයුතු සිදු කරන බවත් ය.

ගරු උප සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් පවසා සිටියේ මේ හා සම්බන්ධ නිලධාරීන් කිහිප දෙනෙක් පමණක් මේ වන විට ජීවතුන් අතර සිටින බව ය.

<u>**තීරණ අංක 03**</u>

කාර්යාල කාර්ය සහායක ඊ.මානෙල් ඒකනායක මිය 1991.02.14 දින සිට ආදේශක පදනම මත මෙම කාර්යාලයේ සේවය කර ඇති අතර 2001 ජූලි මස සිට 2008 ජනවාරි දක්වා කාල සීමාව තුළ EPF අයකර නොමැති බැවින් එම මුදල වන රු.67,577.10 ක මුදල ගෙවන ලෙස කම්කරු උසාවිය මඟින් දන්වා එවා ඇති නිසා මෙම මුදල ගෙවීම සඳහා කොමසාරිස් අනුමැතිය සඳහා යොමු කල අතර එහි දී එම කාල වකවානුව තුළ සේවය කළ වගකිවයුතු අදාල නිලධාරින්ගෙන් අධිභාර මුදල් හා EPF 8% අයකිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර මෙම සේවිකාව හට 2001 ජූලි මස සිට 2008 ජනවාරි මස දක්වා EPF 12% ක මුදල අප සභාව මඟින් ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** කුලී පදනම සේවය කරන සේවකයන් ට වැටුප් ගෙවනු ලබන්නේ දිස්ත්‍රික් මිල කමිටු වාර්තාවට අනුව දිනක වැටුප රු.1,400.00 වන අතර දින 30ක් සේවය කරන ලද සේවකයෙකුගේ වැටුප රු.42,000.00 කි.කම්කරු උසාවියෙන් මානෙල් ඒකනායක මිය සම්බන්ධයෙන් එවා ඇති තීන්දුවට අනුව කුලී සේවකයන්ගෙන් ද ETF හා EPF අයකළ යුතු ය.ඒ අනුව දින 30ක් සඳහා ETF හා EPF සමඟ ගෙවිය යුතු මුළු වැටුප රු.48,300.00 කි.අනියම් පදනම මත සේවය කරනු ලබන සේවකයෙකුගේ දිනක වැටුප රු.808.33 ක් වන අතර දින 30ක් සේවය කරන ලද සේවකයෙකු හට ජීවන වියදම් දීමනාව , මාසික දීමනා , වෙනත් දීමනා , ETF හා EPF සමඟ රු.43,187.39 ක් ගෙවනු ලබයි.ඒ අනුව කුලී පදනම මත සේවය කරනු ලබන සේවකයන් ද අනියම් පදනම යටතේ බඳවා ගැනීමට හැකියාවක් පවතින්නේ නම් සභාවට වාසිදායක බැවින් පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම සඳහා කුලී පදනම යටතේ සේවය කරන සේවකයන් 06 දෙනා අනියම් පදනම යටතේ සේවයට බඳවා ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

*දැනට කුලී පදනම මත සේවය කරන සේවකයින් 06 දෙනා -* එම්.වී.ඒ.උදයරාජ්
ඒ.ඩී.සිල්වා
එස්.ඒ.එස්.ජයරංග
එච්.වසන්තා
එම්.වී.සී.සී.කුමාර
එම්.වී.එම්.විජේධීර

<u>**තීරණ අංක 04**</u>

ඉහත යෝජනාව සභාවට වාසිදායක බැවින් කුලී පදනම මත සේවය කරනු ලබන සේවකයන් ද අනියම් පදනම යටතේ බඳවා ගැනීමට හැකියාවක් පවතින්නේ නම් පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කුලී පදනම යටතේ සේවය කරන ඉහත සේවකයන් 06 දෙනා අනියම් පදනම යටතේ සේවයට බඳවා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**05.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපොළ කඩ කාමර 14 හා විද්‍යාල මාවත කඩ කාමර 03 සඳහා අවසන් වරට දේපළ තක්සේරුවක් ලබා ගෙන ඇත්තේ 2017 වර්ෂයේ දී ය.දැනට වසර 05ක් ඉක්ම ගොස් ඇති හෙයින් 2023 වර්ෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු එම දේපල තක්සේරු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්රාදේශීය සභා මන්ත්රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 05**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපොළ කඩ කාමර 14 හා විද්‍යාල මාවත කඩ කාමර 03 සඳහා 2017 වර්ෂයේ අවසන් වරට දේපළ තක්සේරුවක් ලබා ගෙන ඇති අතර දැනට වසර 05ක් ඉක්ම ගොස් ඇති හෙයින් 2023 වර්ෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු එම දේපල තක්සේරු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** 2022 වර්ෂය සඳහා පැල්මඩුල්ල පොදු වෙළඳපොළ අංක 14 දරණ මාළු කඩ කාමරය ටෙන්ඩරය ලබා ගත් එම්.ඩබ්.මහේෂ් වඩුගේ යන අය විසින් රු.158,924.93ක මුදලක් ගෙවිය යුතු අතර එම අදාල ගාස්තු ගෙවන මෙන් දන්වා අවස්ථා කිහිපයක දී ම ලිඛිතව මෙන් ම දුරකථන මාර්ගයෙන් ම දැනුම් දීම කළ අතර 2022.07.18 වන දින හිඟ ගාස්තු ගෙවීම් සම්බන්ධ ක්‍රමවේදයක් පිළිබඳ සාකච්ඡාවකට පැමිණෙන මෙන් ද බදුකරුට දැනුම් දීම් කරන ලදී.නමුත් මේ සඳහා කිසිදු ප්‍රතිචාරයක් ඔහු විසින් මේ වන විටත් දක්වා නොමැති අතර ගිවිසුම් කොන්දේසි කඩකර සභාව වෙත ගෙවිය යුතු රු.158,924.93 ක මුදල නොගෙවීම සම්බන්ධයෙන් අධිකරණය හමුවේ නෛතික ක්‍රියාමාර්ග ගැනීම හෝ සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 06</u>**

2022 වර්ෂය සඳහා පැල්මඩුල්ල පොදු වෙළඳපොළ අංක 14 දරණ මාළු කඩ කාමරය ටෙන්ඩරය ලබා ගත් එම්.ඩබ්.මහේෂ් වඩුගේ යන අය විසින් රු.158,924.93ක මුදලක් ගෙවිය යුතු අතර එම අදාල ගාස්තු ගෙවන මෙන් දන්වා අවස්ථා කිහිපයක දී ම ලිඛිතව මෙන් ම දුරකථන මාර්ගයෙන් ම දැනුම් දීම කළ අතර 2022.07.18 වන දින හිඟ ගාස්තු ගෙවීම් සම්බන්ධ ක්‍රමදෙයක් පිළිබඳ සාකච්ඡාවකට පැමිණෙන මෙන් ද බදුකරුට දැනුම් දුන්න ද කිසිදු ප්‍රතිචාරයක් ඔහු විසින් මේ වන විටත් දක්වා නොමැතිව , ගිවිසුම් කොන්දේසි කඩකරමින් සභාව වෙත ගෙවිය යුතු රු.158,924.93 ක මුදල නොගෙවීම සම්බන්ධයෙන් අධිකරණය හමුවේ නෛතික ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**07.** රටේ පවතින ආර්ථික තත්වය අනුව සතිපොළ සංකීර්ණය නඩත්තු කිරීම සඳහා වැය වන පිරිවැය ඉහළ යාම හේතුවෙන් සතිපොළ ගාස්තු අය කිරීම පහත පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| කාරණය | පවතින ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| සතිපොළ ගොඩනැගිල්ල ඇතුළත ස්ථිර වෙළඳ ස්ථානයක් සඳහා | රු.200.00 | රු.250.00 |
| සතිපොළ භූමිය තුළ තාවකාලික වෙළෙඳ ස්ථානයක් සඳහා | රු.150.00 | රු.200.00 |
| මාර්ගය දෙපස තාවකාලික වෙළෙඳ ස්ථානයක් සඳහා | රු.130.00 | රු.180.00 |
| වෙනත් සුළු වෙළෙඳුන් සඳහා ( ජංගම වෑන් රථයක් / ත්‍රී රෝද රථයක් වැනි ) | රු.100.0 | රු.150.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ හා සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ දැනට අප සභාවේ අඩු ම සතිපොළ ගාස්තු හා කොම්පෝස්ට් පොහොර ගාස්තු පවතින බැවින් මෙම මුදල් අය කිරීම සාධාරණ බව ය.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මිල වැඩි කිරීම් සුදුසු නැති මුත් සභාවේ කටයුතු ඉදිරියට සිදු වීමට මුදල් අවශ්‍ය වන නිසා මෙම ගාස්තු වැඩි කිරීම් අසාධාරණ නොවන බවත් , වෙළෙඳපොලේ රු.70.00 පමණ පැවති භාණ්ඩ රු.280.00 පමණ දක්වා මිල වැඩි කිරීම් සිදු වී ඇති නිසා සභාවට ද සේවය සැපයීම වෙනුවෙන් අය කරන ගාස්තු වැඩි කිරීමට සිදු වන බව ය.

**<u>තීරණ අංක 07</u>**

ඉහත යෝජනාව සලකා බලා රටේ පවතින ආර්ථික තත්වය අනුව සතිපොළ සංකීර්ණය නඩත්තු කිරීම සඳහා වැය වන පිරිවැය ඉහළ යාම හේතුවෙන් සතිපොළ ගාස්තු අය කිරීම ඉහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**08.** පහත සඳහන් දේපල හිමිකරුවන්ගේ දේපළ සඳහා නව වරිපනම් අංක අනුමත කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

| අනු අංකය | මුල් ඉඩමේ වරිපනම් අංකය | මාර්ගය | වරිපනම් ලේඛනය පරිදි අයිතිකරු | යෝජනා කරනු ලබන අංකය | ලේඛනයේ ඇතුළත් විය යුතු අයිතිකරු | දේපල විස්තරය | වාර්ෂික වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 01 | - | වලව්වත්ත පාර දකුණ | - | 20/6 | ගනේගොඩ දිසානායකගේ ජානක ප්‍රසන්න | ඇස්බැස්ටෝස් සෙවිලි නිවස | රු.25,981.00 |
| 02 | 1775 | රත්නපුර පාර වම | අයිතිකරු | 1775/1/1 | යකුන්දාවල ලියනආරච්චිලගේ අබිල චතුරංග ගුණරත්න | කොන්ක්‍රීට් වහලය සහිත පළමු මහල | රු.3,108.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 08</u>**

ආදායම් පරීක්ෂකතුමියගේ වාර්තාව ද සලකා බලා ඉහත සඳහන් දේපල හිමිකරුවන්ගේ දේපළ සඳහා නව වරිපනම් අංක ලබා දීම සුදුසු බවට ඒකමතාකව සහා සම්මත විය.

**09.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් පොහොර විකිණීමේ ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| කොම්පෝස්ට් පොහොර විකිණීම | පවතින මිල | සංශෝධිත මිල |
|---|---|---|
| තොග මිල ( කිලෝ 01 ) | රු. 10.00 | රු. 15.00 |
| සිල්ලර මිල ( කිලෝ 01 ) | රු. 12.00 | රු. 20.00 |
| කොම්පෝස්ට් පොහොර අලෙවිසැල - කිලෝ 05ක පැකට් 01ක් | රු. 80.00 | රු.130.00 |
| කිලෝ 10 ක පැකට් 01ක් | රු.150.00 | රු.230.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 09</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් පොහොර විකිණීමේ ගාස්තු ඉහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.කාරක වාර්ථා සලකා බැලීම - 2022-07-14 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

2022-07-14 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07.2022-07-01 සිට 2022-07-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ සභාවේ දැනට ඉන්ධන කොපමණ ප්‍රමාණයක් අත්‍යවශ්‍ය සේවා සඳහා ගබඩා කර තිබේ ද යන්න ය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ලීටර් 250ක් පමණ ගබඩා කර ඇති බව ය.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ සභාවේ වියදම් පිළිබඳව අධීක්ෂණයෙන් සිටිය යුතු බවත් , 2021 වසරේ විගණන වාර්තාවේ මතය වටිනා බවත් , ඊළඟ වර්ෂයේ විගණනයට මීටත් වඩා හොඳ මූල්‍ය ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බවත් ය.තව ද ආදාහනාගාරයේ ආදාහනාගාර කටයුතු සිදු කිරීමේ දී පෙට්‍රල් නොමැති වීම ගැටළුවක් වුනා ද යන්නත් , පහල කුට්ටපිටිය හෙලඋඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අදාලව මුදල් ගෙවීම සඳහා ප්‍රතිපාදන පිළිබඳවත් , ආදාහනාගාරයට යන මාර්ගය සකස් කළ හැකි නම් සුදුසු බවත් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.

පෙට්‍රල් නොලැබීම ගැටලුවක් වූ බවත් , දැන් විදුලිය විසන්ධි කිරීමේ කාලය තරමක් දුරට අඩු වීම නිසා පෙර පරිදි කටයුතු කිරීමට හැකි බවත් , පහල කුට්ටපිටිය හෙලඋඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අදාල ව්‍යාපෘතිය 2021.12.31 දිනට අවසන් කළ ව්‍යාපෘතියක් බවත් , පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපාදන ලැබුනු බවත් ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

ජූනි මාසයට 5-23-II යටතේ සතිපොළෙහි අදායමක් නොතිබේ ද යන්න ගරු ප්‍රාෙද්ශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විමසන ලදී.ගරු සභාපතිතුමා විසින් එය පැහැදිලි කරන ලදී.

2022-07-01 සිට 2022-07-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**08.වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ශ්‍රී ලංකාවේ අටවෙනි විධායක ජනාධිපතිවරයා වශයෙන් තේරී පත් වූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට සුභ පැතුම් එක් කරමින් වැඩ කටයුතු සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරන බවත් ය.තව ද වෙනත් දිස්ත්‍රික්කයක පළාත් පාලන මන්ත්‍රීවරියෙකුට පහර දීම හෙළා දකින බවත් , අප සභාවේ සියලු ම මන්ත්‍රීවරුන් එක්ව කටයුතු කළ ආකාරයට ම ඉදිරියටත් එක්ව කටයුතු කරමු යන්නත් , ප්‍රාදේශීය සභා කමිටු ක්‍රියාත්මක කළ යුතු බවටත් එතුමා අදහස් දක්වන ලදී.

ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අතීත දේශපාලන සංස්කෘතිය තුළ දේශපාලන රැස්වීම් පැවැත්වීමට අවස්ථාවන් ලබා නොදී කඩාකප්පල් කරන බවත් , පෝස්ටරයක්වත් ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා නොදුන් බවත් , ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ රැස්වීමක් පැවති බවත් , ඒ පිළිබඳව ගරු සභාපතිතුමාට පැවසූ පසු සතිපොළ භූමිය වෙන් කර දුන් බවත් , ගරු ලේකම්තුමා හා මහජන පරීක්ෂකතුමා මෙන් ම සභාවේ සේවකයන් ද අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කටයුතු කළ බවත් , ඒ සම්බන්ධව ස්තූතිවන්ත වන බවත් , වතුර බෝතල් ලබා ගැනීම සඳහා ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමියට දුරකතන ඇමතුමක් ලබා ගත් අවස්ථාවේ නලින්ද මහත්මා නොමිලේ ම වතුර බෝතල් ලබා දුන් බවත් , දැන් පවතින ප්‍රවේශය හොඳ බවත් එය ඉදිරියට කර ගෙන යා යුතු බවත් , එය හොඳ ආදර්ශයක් බවත් , එකිනෙකාට වෛර නොකරන බුද්ධිමත් ජනතාවක් වර්තමානයේ සිටින බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ. ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ රට තුළ විය යුත්තේ එය බවත් , විවිධ ජාතීන් වශයෙන් දැන් තිබෙන සංස්කෘතිය ගැන සංතෝෂ වන බවත් , දැන් බියක් නොමැතිව දේශපාලනය කර ගෙන යා හැකි බවත් , එය ඉදිරියට කර ගෙන යා යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ජනතාව බලාපොරොත්තු වූ පරිදි ජනමතයකින්ම පාලනයක් බිහි කිරීම සිදු නොවූ බව ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ විධායක ජනාධිපතිවරයා වශයෙන් තේරී පත් වූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට හදවතින් ම ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සුභ පැතුම් එක් කරන බවත් , සියලු කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සිදු වූ බවත් , ජනතාවට යහපතක් සිදු වේ නම් ආර්ථික හා දේශපාලන අර්බුදය විසඳීමට සහයෝගය ලබා දෙන බවත් , පවතින තත්වයත් සමඟ මැතිවරණයකට යාමට අපහසු කාලයක් බවත් , තව ද දැනට පාර්ලිමේන්තුව ජනතාවගේ ගැටලු හඳුනා ගෙන නොමැති බවත් , රට වෙනුවෙන් කටයුතු කිරීමට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ අදහස් අවතක්සේරු කිරීම සුදුසු නැති බවත් , එතුමා මෙන් ම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා ද පරිසරය පිළිබඳව බොහෝ අවස්ථාවන් වල දී කතා කළ බවත් , මාස 06කින් පැල්මඩුල්ල සංවර්ධනය කිරීමට ගරු සභාපතිතුමාගේ බලාපොරොත්තු වූ නමුත් සියලු දෙනාගෙම අවාසානාවට පැවති වාතාවරණය සමඟ එය කිරීමට නොහැකි වූ බවත් , ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතුම් එක් කරන බවත් ය.

ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සති අන්තයේ රූපවාහිනියේ ප්‍රචාරය වූ "කළු ගඟ දිගේ" වැඩසටහන නිසා පැල්මඩුල්ලට විශේෂ අවධානයක් ලැබුනු බවත් , එහි නිවේදක මෙන් ම අතිදක්ෂ කලාකරු ජැක්සන් ඇන්තනී මැතිතුමා මේ වන විට බරපතල අනතුරකට ලක් වී රෝහලේ හදිසි ඒකකයේ ප්‍රතිකාර ලබා ගන්නා බවත් , සභාව වෙනුවෙන් එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් ය.තව ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා නොසලකා හරින බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය විසින් පැවසූ බවත් කිසිම දිනක එසේ නොකළ බවත් , සියලු දෙනාගේ ම අදහස් වටිනා බවත් , ඒවා අගය කරන බවත් එතුමා පවසන ලදී.විගණන මතය ලැබීම සම්බන්ධව සතුට හා ස්තුතිය පුද කරන බවත් , විගණන මතයක් ලබා ගැනීම පළාත් පාලන ආයතන ගත් විට ඉතා අපහසු කාර්යයක් බවත් , විගණන මතයක් ලබා ගැනීමට තරම් දක්ෂ නිලධාරීන් පිරිසක් අප සභාවේ සේවයෙහි නිරත වන බවත් , ඒ සම්බන්ධව සභාපතිතුමා , ලේකම්තුමා ඇතුළු ඒ සම්බන්ධව කටයුතු කළ කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටම ගෞරවය හා ස්තුතිය පුද කරන බවත් , විදුලි බිල් ගාස්තු වැඩි කර ඇති බවත් , වෙළෙඳපොළෙහි භාණ්ඩ මිල ගණන් වැඩි වී ඇති බවත් , ජනයාට එය දරා ගත නොහැකි බවත් එතුමා පවසන ලදී.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගතිය සාකච්ඡා කිරීම.**
- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමාහට , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පියසේන මැතිතුමාහට , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙල්වනායගම් රගවන් මැතිතුමාහට හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමියහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම**

මහා සභාව 2022 සැප්තැම්බර් 08 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උපසභාපති තුමන්, විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

පෙ.ව.11.50 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

2022-08-31 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදීය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා ................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ....................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

.

2022-09-08 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදීය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව